උ. ප. රා. සේ.කො.ස චක්‍ර ලේඛ අංක : 11 / 2018

මගේ අංක NP/07/10/01/107
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
යාපනය.
26.03.2018.

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාරතුමාගෙ ලේකම්,
අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
උතුරු පළාත.

## උතුරු පළාත් රාජ්‍ය සේවයේ පවතින පළාත් කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය – 2018

උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් කළමනාකරණ සහකාර සේවයේ III වනි ශ්‍රේණියේ තනතුරු සඳහා පවතින පුරප්පාඩු **91** ක් (**පුරප්පාඩුවලින් 30%**) සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2018 මැයි මස** පවත්වන බව දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **26.04.2018**වේ.

**02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-**

02.1 **2013.04.02** වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද පළාත් කළමනාකරණ සහකාර සේවා තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාව හා බඳවා ගැනීමේ සැලැස්මේ නිර්දේශ කරන ලද කොන්දේසින්ට හා එම තනතුරුවල සේවා ව්‍යවස්ථාවේ ඉදිරි කාලවලදී සිදුකරනු ලබන කිසියම් සංශෝධනයන්ට හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා සමාජවාදි ජන රජයේ අංක **1817/30** සහ **2013.07.03** වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආයතන සංග්‍රහය යනාදියට අනුකූලව තෝරා ගනු ලබන අයදුම්කරුවන් අදාල පළාත් කළමනාකරණ සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

02.2 මෙම විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් පත්වීම් දිනයේ සිට වසර 03 පරිවාස කාලයකට යටතේ III වැනි ශ්‍රේණි තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළාත් කළමනාකරණ සහකාර තනතුරේ III වනි ශ්‍රේණියට බඳවා ගන්නා ලද දිනයේ සිට වසර 03 ක කාලයක් ඇතුලත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතුය.

02.3 මෙම සේවය ස්ථානමාරු සහිත සේවයකි. එබැවින් මෙම පත්වීම් ලබන අයදුම්කරුවන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළයුතු බවට වූ කොන්දේසියට යටත්විය යුතුය.

02.4 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන රියදුරා එකී සේවා ස්ථානයේම අවම වශයෙන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළයුතු බවට අනිවාර්ය වූ කොන්දේසියකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 01/2014 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දි නිකුත් කරණු ලබන චක්‍ර ලේඛ වලට අනුව පත්වීමේ දිනයේ සිට වසර 05 ක් අවසන්වීමට පෙර එහි සඳහන් දෙවන රාජ්‍ය භාෂාවකින් සමත්විය යුතුය.

02.6 පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක කරණු ලබන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරණු ලැබේ. ඇතැම් පුරප්පාඩු හෝ සම්පූර්ණ පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමට පත්වීම් බලධාරියාට බලය ඇත. පත්කරනු ලබන නිලධාරී සංඛ්‍යාව **පවතින පුරප්පාඩුවලින් 30% ක්** වේ.

**03. වැටුප් පරිමාණය:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016ට අනුව (කේත අංක **MN-2-2016**) පළාත් කළමනාකරණ සහකාර තනතුරේ III වන ශ්‍රේණියේ තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය මාසිකව **රු. 28,940 - 10 x 300/= - 11 x 350/= - 10 x 560/= - 10 x 660/= - රු 47,990 ක් වේ.** (රු. 29,840/= වැටුප් පියවරට පැමිණීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකින් සමත් විය යුතුය) කෙසේ වූව ද ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

**04. සාමාන්‍ය සුදුසුකම් :-**

04.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම හෝ ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි මනා ශරීර සෞඛ්‍යකින් හා මනා චරිතවත් පුද්ගලයෙක් විය යුතුය.

04.3 මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර ඉල්ලුම් කරන ලද සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු ය

04.4 සීමිත තරඟ විභාගයක් මගින් බඳවා ගන්නා විට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**05 අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-**

**05.1 අධ්‍යාපන සුදුසුකම් ඃ-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන සමාර්ථයන් දෙකක් (02) ඇතුළුව සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය/අංක ගණිතය/ශුද්ධ ගණිතය /මූලික ගණිතය/වානිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (06) සමත්වී තිබීම.

**05.2 පළපුරුද්ද ඃ-**

(අ) උතුරු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් දරන, එම පත්වීම්වල සේවය ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 03/2016 අනුව PL 1- 2016, PL 2 -2016, PL 3 – 2016, MN 01-2016 වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් විය යුතුය.

(ආ) නියමිත දිනට පෙර උතුරු පළාත් රාජ්‍ය සේවයේ අවම වශයෙන් වසර 05 ක අඛණ්ඩ ස්ථිර හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, එය ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

**සටහන :**
**යම් කිසි තනතුරකට ස්ථිරව පත් කිරීමට ප්‍රථම සේවය කර ඇති හෝ යම් කිසි තනතුරකට අදාලව ස්ථිර වශයෙන් පත් කිරීමට කොන්දේසියක් වශයෙන් සේවය කර ඇති හෝ පුහුණුවක් ලැබීමේ කාල සීමාවක් ලෙස ඉහත 05.2 (ආ) හි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමවක් ලෙස ගණන කරනු ලබන්නේ නැත. කිසියම් තනතුරකට ස්ථිර පත්වීමක් ලබා දීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාලයද ඉහත සඳහන් 05.2 (ආ) හි සඳහන් කර ඇති සුදුසුකම් ලබා ගැනීමට එය පසු අවුරුදු කාලසීමාවක් ලෙස ගණනය කරනු නොලැබේ.**

**සැලකිය යුතුයි :-**
**සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2018.04.26 වන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

**06 බඳවා ගැනීමේ ක්‍රමය:-**

06.1 ලිඛිත පරීක්ෂණයක් පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ, බඳවා ගැනීමේ පරිපාටිය ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදියට අනුව බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍යවන සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. ඒ සඳහා අමතර ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

06.2 ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන අපේක්ෂකයින්ගෙන් ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලැබූ මුලු ලකුණු සංඛ්‍යා අනුපිළිවෙල පරිදි පවතින පුරප්පාඩු සඳහා පත්වීම් ලබාදීමට තෝරාගනු ලැබේ

06.3 කළමනාකරණ සහකාර III වන ශ්‍රේණිය සඳහා පවතින පුරප්පාඩු වලින් 30% ක් විවෘත තරඟ විභාගයෙන් සුදුසුකම් ලබන අපෙක්ෂකයන්ගෙන් පුරවනු ලැබේ

06.4 පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට තුනක් (03%) ආබාධිතයන් සඳහා වෙන් කරනු ලැබේ තෝරා ගනු ලබන අපේක්ෂකයන් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් 50% ක් ලබාගත යුතුයි පත්වීම සඳහා තෝරා ගන්නා අපේක්ෂකයෙක් තම ආබාධිත තත්ත්වය අදාල තනතුරේ සේවය කිරීමට කිසිදු බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය වාර්තාව මගින් සනාථ කළ යුතුයි

**සටහන :**

අපේක්ෂකයා ආබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානය මගින් විධිමත් පරිදි අයදුම් කරන බවට අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු අතර ආබාධිතයකු නොවන අපේක්ෂකයෙක් තමා ආබාධිතයකු බවට සඳහන් නොකළ යුතුයි

**07 විභාග ගාස්තු :-**

අයදුම්කරු පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු. 500/= ක මුදලක් **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමාගේ අංක 3401** දරණ තැන්පත් ගිණුමට බැර කරන ලද මුදල් කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා ඉදිරිපත් කළ යුතුය. කුමන කරුණක් මත හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට අනුමත කරනු නොලැබේ.

**08 ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-**

08.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ (සෙමී 21 x සෙමී 29) ප්‍රමාණයේ කොළයක 1 සිට 4.5 දක්වා වූ කොටස් පළමුවැනි පිටුවේ, හා 4.6 සිට 7.0 දක්වා වූ කොටස් දෙවන පිටුවේත්, අනෙක් කොටස් තුන්වන පිටුවෙත් ඇතුලත්වන පරිදි අයදුම් පත්‍රය පිළියෙළ කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2018.04.26** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙගත හැකි පරිදි **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත අංක 393/48, කොවිල් පාර, නල්ලූර්, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08.2 අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් කළමනාකාරණ සහකාර සේවයේ III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2018"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.3 අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් තමාවෙත තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් සහ පූර්ව පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු විසින් සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.

08.4 අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 ට වත් කලින් ප්‍රවේශ පත්‍රය ලැබුණේ නැතිනම් ඒ බවට පහත සඳහන් විස්තර සහිතව **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කොවිල් පාර, යාපනය** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය **021- 221 9939**, පැක්ස් අංකය **021- 221 9940**)

**සටහන:**

ඉල්ලීමේ ලිපිය, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුණුම් පත් අංකය, අයදුම්කරුගේ තැපැල් ලිපිනය, අයදුම් පත්‍රයේ පිටපතක්, අයදුම් පත්‍රය ලියාපදිංචි තැපෑල යොමු කරන ලද තැපැල් කාර්යාලය, ලියා පදිංචි අංකය සහ දිනය, විභාග ගාස්තු ගෙවූ සහතික කරන ලද ඡායා පිටපත , ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු පැක්ස් අංකය.

**09 පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම:-**

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපතිට සෑහීමකට පත්විය හැකි අයුරින් තම අනන්‍යතාවය තහවුරු කරනමෙන් ඉල්ලා සිටිනු ලැබේ. පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන වලින් කුමණ හෝ එකක් පිළිගණු ලැබේ.

(1) පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමෙන්තුව විසින් නිකුත් කරන ලද හැඳුණුම් පත.
(11) වළංගු විදේශ ගමන් බලපත්‍රයක්. (Passport)

ඉහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම් කරුවෙකුගේ හිමිකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ගේ අභිමතය පරිදි අවලංගුකළ හැකිය. විභාගය පැවැත්වීම පිළිබඳව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නිති රීතිවලට අයදුම්කරුවන් අවනතවිය යුතුය. එකී නිති රීතිවලට පටහැනිව කටයුතු කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත්විය යුතුය.

**10 අසත්‍ය තොරතුරු සඳහා දඬුවම් ඵ-**

අයදුම්පත්‍ර පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුයි.මෙම විභාග කොන්දේසිවලට අනුව යම්කිසි අපේක්ෂයන් විභාගයට පෙර, විභාගයේදී හෝ විභාගයට පසුව කුමන හෝ අවස්ථාවකදී සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත්, එම අයදුම්කරුගේ විභාග අයිතිවාසකම් එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු සපයන ලද තොරතුරු කිසිවක් අසත්‍ය බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කල හැක.

**11 විභාග පරිපාටිය:-**

මෙම ලිඛිත පරීක්ෂණය පහත සඳහන් ප්‍රශ්නපත්‍ර ඇතුලත් වන අතර මෙම විභාගය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍ය වලින් පවත්වනු ලැබේ අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට අවස්ථාව නොදෙනු ලැබේ.

| අංක | ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු |
|---|---|---|---|
| 01 | අභියෝගයතා පරීක්ෂණය | පැය **01**යි | **100** යි |
| 02 | කළමනාකරණ සහකාර සේවයේ භාෂණ හැකියාව සහ සුදුසුකම් හඳුනාගැනීමේ පරීක්ෂණය | පැය **02 1/2** යි | **100** යි |

**අභියෝග්‍යතාවය ඃ-**

මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේක්ෂකයන්ගේ සංඛ්‍යානමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

**කළමනාකරණ සහකාර සේවයේ භාෂණ හැකියාව සහ සුදුසුකම් හඳුනාගැනීමේ පරීක්ෂණය ඃ-**

අපේක්ෂකයින්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද තොරතුරු අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින්ද, කාර්යාලයක ලියවිලි සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය පිළිබඳ මූලික නීති රීති සහ කළමනාකරණ සහකාර නිලධරයකු විසින් කටයුතු කළයුතු කරුණු අඩංගු ලිපියක් පිළිබඳ ක්‍රියාකරන ආකාරය ආදී කළමනාකරණ සහකාර නිලධරයකුගේ රාජකාරී පිළිබඳව අයදුම්කරුවන් සතු දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නවලින්ද, කාර්යාලයක ප්‍රයෝජනයට ගන්නා ඇමතුම් දින පොත, වවුචර්, චලන පත්‍රිකා, පැමිණීමේ ලේඛනය, දින මුද්‍රාව හා නාම මුද්‍රාව, තැපැල් මල්ල ආදී උපකරණ ගැනත් ඒවායින් ඇති ප්‍රයෝජන ගැනත් අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින්ද යුක්ත වේ.

**සටහන :-**

මෙම පත්වීම සඳහා සුදුසුකම් ලබා ගැනීමට ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්ණ පත්‍ර සියල්ලටම අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුවේ. සමස්ත ලකුණුවලින් අවම වශයෙන් ලකුණු 50% ක් ලබා ගත යුතුයි.

**12 විභාග ප්‍රතිඵල :-**

අපේක්ෂකයන් ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ **www.np.gov.lk** වෙබ් අඩවියෙහි පළ කරන අතර පසුව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තැපැල් මගින් නිකුත් කරනු ලැබේ.

**13** විභාගය පැවැත්වීම සඳහා නිශ්චිත නගර හා එම නගර සඳහා වූ අංක පහත් සඳහන් වේ

| <u>නගරය</u> | <u>නගර අංකය</u> |
|---|---|
| යාපනය | **01** |
| මන්නාරම | **02** |
| වවුනියාව | **03** |
| කිලිනොච්චිය | **04** |
| මුලයිතිව් | **05** |

විභාගය පැවැත්වීම සඳහා එක් නගරයකින් ලැබෙන අයදුම්පත්වල සංඛ්‍යාව අඩු වූ අවස්ථාවකදී මෙම විභාගය ළඟම ඇති නගරයක පැවැත්වීමට කටයුතු කරනු ලැබේ

**14** මෙම විභාගය පැවැත්වීම හා අවලංගු කිරීමේ බලය **"උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්** සතු වේ. මෙම නිවේදනයේ ඇති දෙමළ හෝ සිංහල භාෂා මාධ්‍යවල යම් කිසි වෙනසක් ඇති විටෙක, දෙමළ භාෂාවේ සඳහන් නිවේදනය නිවැරදි නිවේදනය බව සැළකිය යුතුවේ.

**සි.ඒ.මොහන්රාස්**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
26.03.2018